13

චක්‍රලේඛ අංක:- 12/2005

මගේ අංකය:- බප/සසේකො/ලේ.තිර්
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
අංක. 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2005.10.18

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති
සභාපතිවරුන් වෙත,

**වෙළඳසැල් කළමණාකරු තනතුරු සඳහා දැනට අනුමත සුදුසුකම්**
**සංශෝධනය කිරීම.**

වෙළඳසැල් කළමණාකරුවන් බඳවා ගැනීමේ අපහසුතාවය බොහෝ කාලයක සිට සමූපකාර සමිති විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ඉල්ලීම් අතර ප්‍රධාන වූවක් බව පෙනී යන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කල කොමිෂන් සභාව 2005.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙළඳසැල් කළමණාකරුවන් සඳහා වන සංශෝධනය කරනු ලැබූ සංශෝධිත බඳවා ගැනීම් පරිපාටිවල පිටපතක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවමි. තවද දැනටමත් සමිති-වල සේවයේ නිරත සේවකයින් සඳහා සංශෝධනයන්හි සඳහන් උපරිම වයස් සීමාව බල නොපාන බවද කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙමි.

02. මෙය ලැබුණු බව දන්වන්න.

කේ.කේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාත් සමූපකාර, පළාත්මාර්ග හා විදුලි බල අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, සමූපකාර, පළාත්මාර්ග හා විදුලිබල අමාත්‍යාංශය (බ.ප.)
4. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගම්පහ)
6. ලේකම්, සමූපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. සියළුම වෘත්තීය සමිති සංගම්